# රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
# பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
# Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | 75/10/GRADE III | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2024.08.05 |

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

කොමිෂන් සභා ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීම සඳහා නිර්දේශ සහ ලිපි ලේඛන ඉදිරිපත් කිරීම</u>**

2021.08.02 දිනැතිව විවෘත පදනම මත ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවාගන්නා ලද නිලධරයන්ගේ වසර තුනක පරිවාස කාලය 2024.08.02 දිනට අවසන් වේ. ඒ අනුව, එදිනට නියමිත සුදුසුකම් සපුරා ඇති නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා පහත දක්වා ඇති අනුපිළිවෙලින් අදාළ ලිපි ලේඛන **ඔබගේ නිර්දේශය සහිතව** අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ.), ශ්‍රී ලංකා පරිපාලන සේවා අංශය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, නිදහස් චතුරස්‍රය, කොළඹ 07 ලිපිනය වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වමි.

I. වැඩ, පැමිණීම, හැසිරීම සතුටුදායක බවට ආයතන ප්‍රධානියාගේ නිර්දේශය
II. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ අංක 8 පරිශිෂ්ඨය ප්‍රකාරව පත්වීම් දින/ පත්වීම භාරගන්නා ලද දින සිට වසර තුනක පරිවාස කාලය අවසන් වන දිනය දක්වා කාලයට අදාළ වාර්ෂික සමාලෝචන වාර්තාවන්හි සහතික කරන ලද පිටපත් දෙක බැගින්
III. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සේවාරම්භක පුහුණුව අවසාන කර ඇති බවට නිකුත් කර ඇති සහතිකයේ සහතික කරන ලද පිටපත් දෙකක්
IV. පත්වීම් ලිපියෙහි දැක්වෙන විධිවිධාන අනුව නිලධරයා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සේවාරම්භක පුහුණුව සඳහා වාර්තා කල දිනය දැක්වෙන ලිපියෙහි සහතික කරන ලද පිටපත් දෙකක්
V. නිලධාරියා සේවයට සුදුසු බව දැක්වෙන සෞඛ්‍ය 169 වන ආකෘති පත්‍රය ප්‍රකාරව නිකුත් කළ වෛද්‍ය පරීක්ෂණ වාර්තාවේ සහතික කරන ලද පැහැදිලි පිටපතක්

VI. නිලධරයාගේ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල සනාථ කිරීම සඳහා මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරන ලද ප්‍රතිඵල ලේඛනයෙන් බාගත කරන ලද පිටපත් දෙකක්

VII. ආයතන ප්‍රධානියා විසින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයෙන් නිලධරයා නිදහස් කරන ලද ලිපියේ සහතික කළ පිටපත් දෙකක්


එස්. ආලෝකබණ්ඩාර

අතිරේක ලේකම් (රාජ්‍ය පරිපාලන) (වැ.බ.)

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට

දුරකථන : 0112-698605

ෆැක්ස් : 0112-683651

විද්‍යුත් ලිපිනය : pubad.dslas@gmail.com